10 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

## 20 පාඩම


**සැකසුම හා ඉදිරිපත් කිරීම**

**ඒ. වී. චමින්ද විජේකුමාර ආරියදාස මයා**

**කෑ/ දෙහි/ සීපෝත් සේනානායක ක. වි.**

**අධීක්ෂණය**

**බී.ඒ.අයි.අයි.සංජු ලෝචන මයා**

**සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල හා ආගම)**

**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**

chamindavijeekumara@gmail.com

දු.ක. අංකය :- 0718416477, 0702035765

# 20 පාඩම
# හෙළ කලාවන් සුරකිමු


හෙළ කලාවන් සුරකිමු

# හෙළ කලාවන් සුරකිමු

**මහින්දාගමනයෙන් හා දුමින්දාගමනයෙන් පසු මෙරටට උරුම වූ කලා ශිල්ප**

- චිත්‍ර කලාව
- කැටයම් කලාව
- මූර්ති කලාව
- ගෘහ නිර්මාණ කලාව

# ස්තූපය




- විහාරස්ථානයක මූලික අංගයකි.
- බුදුරදුන්ගේ ශාරීරික චෛත්‍ය නිරූපනය කරයි.
- ලක්දිව මුල් ම ස්ථූපය ලෙස සැලකෙන්නේ අනුරාධපුර ථූපාරාම දාගැබයි

# ගර්භයේ ස්වරූපය අනුව ස්තූප ආකෘති වර්ග

1. ඝන්ටාකාර - සීනුවක හැඩය
2. ඝඨාකාර - කළයක හැඩය
3. බුබ්බුලාකාර - දිය බුබුළක හැඩය
4. ධාන්‍යාකාර - ධාන්‍ය ගොඩක හැඩය
5. පද්මාකාර - පියුමක හැඩය
6. ආමලකාකාර - නෙල්ලි ගෙඩියක හැඩය

# ශ්‍රී ලංකාව තුළ දැක ගත හැකි ස්තූප ආකෘති







**සන්ධ්‍යාකාර**

- සණ්ඨාරයක හැඩයට තනන ලද ස්ථූප මෙම නමින් හැඳින්වෙන අතර ආසියාව තුළ මෙම ස්තූප බෙහෙවින් ජනප්‍රියත්වයට පත්ව ඇත.
- උදා:- අනුරාධපුර ථූපාරාම ස්ථූපය,
  11 සියවසට අයත් මහියංගණ ස්ථූපය

# ශ්‍රී ලංකාව තුළ දැක ගත හැකි ස්තූප ආකෘති







## ඝණ්ටාකාර

- කළයක හැඩයට තනන ලද ස්තූප මේ නමින් හැඳින්වේ.
- මෙම හැඩයේ ස්තූප තිබ්බතයේ බෙහෙවින් ජනප්‍රියය.
- උදා;-තිස්සමාහාරාමයෙන් මේ ආකාරයේ ධාතු කරඬුවක් හමු වී ඇත. කතරගම කිරිවෙහෙර මුලින් මෙම හැඩයෙන් යුක්තව තිබී ඇත. සෝමාවතිය චෛත්‍ය, සිතුල්පවුව චෛත්‍ය

# ශ්‍රී ලංකාව තුළ දැක ගත හැකි ස්තූප ආකෘති







## බුබ්බුලාකාර

- දිය බුබුලක හැඩයට තනන ලද ස්තූප මේ නමින් හැඳින්වේ.
- උදා:- ක්‍රි.පූ. 2වන සියවසට අයත් රුවන්වැලිසෑය,
  අභයගිරි චෛත්‍යය

# ශ්‍රී ලංකාව තුළ දැක ගත හැකි ස්තූප ආකෘති

## ධාන්‍යාකාර

- වී ගොඩක හැඩයට තනන ලද ස්තූප මේ නමින් හඳුන්වනු ලැබේ.
- උදා:- කැලණිය ස්තූපය



# ශ්‍රී ලංකාව තුළ දැක ගත හැකි ස්තූප ආකෘති







**පද්මාකාර**

- නෙලුම් මලක හැඩයට තනන ලද ස්තූප මේ නමින් හඳුන්වනු ලැබේ
- උදා:- දැදිගම කොටවෙහෙර, පොළොන්නරුව දෙමළ මහා සෑය


# ශ්‍රී ලංකාව තුළ දැක ගත හැකි ස්තූප ආකෘති

- ❖ නෙල්ලි ගෙඩියක හැඩය ගන්නා ස්ථූප මෙම නමින් හඳුන්වයි
- ❖ උදා:- දැදිගම කොටවෙහෙරින් හමු වූ ස්ථූපය (මහාචාර්ය චන්ද්‍රා වික්‍රමසිංහ මහතාගේ මතයට අනුව)




ආමලකාකාර

# ස්තූපයක හඳුනා ගත හැකි අංග



01. චූඩාමාණික්‍යය

02. කොත් කැරැල්ල

03. දේවතා කොටුව

04. හතරැස් කොටුව

05. ගර්භය

06. තුන් මහල් පේසාව

07. සලපතළ මළුව

08. වැලි මළුව

# චෛතියගර හෙවත් වටදාගෙය




- ස්තූපය සඳහා ඉදි වූ වෘත්තාකාර පියස්සක් සහිත ගෘහය මෙනමින් හැඳින්වේ
- ස්තූපයේ ආරක්ෂාව හා බැතිමතුන්ගේ ආරක්ෂාව සැලකිල්ලට ගෙන මෙය නිර්මාණය කර ඇත
- කුඩා පරිමාණයේ ඇතැම් ස්තූප සඳහා ඉදිකර තිබූ බවට අද ද සාක්ෂි ඇත
- උදා:- ථූපාරාමය

  අම්බස්තලය


  ලංකාරාමය


  මැදිරිගිරිය

  පොළොන්නරුව වටදාගෙය

# වාහල්කඩ/ ආයක







- ✓ ඇතැම් ස්තූපවල ගර්භයට සම්බන්ධ සිව් දිසාවට මුහුණලා තනන ලද අපංකාර තොරණ වැනි අංගයකි.
- ✓ මෙය අලංකාරාත්මක කැටයම් වලින් යුක්තය.
- ✓ මිහින්තලේ කණ්ඨක චෛත්‍යයහි නැගෙනහිර වාහල්කඩ උසස් කලාත්මක නිර්මාණයකි.

# බෝධිඝර




- බෝධීන් වහන්සේ වටා නිමවන ලද පටු පියස්සක් සහිත මණ්ඩපයය බෝධිඝරය ලෙස හැඳින්වේ.
- මෙතෙක් හමු වී ඇති කලාත්මක බවින් උසස් ම බෝධිඝරය කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිල්ලක්ගම පිහිටා ඇත.

# පියගැටපෙළ

- බෞද්ධ විහාරස්ථානයකට හෝ වෙන යම් ගොඩනැගිල්ලකට පිවිසීමට ඉදි කර ඇත.
- වාමන රූප, පලාපෙති ආදී කැටයම්වලින් මේවා අලංකාර කර ඇත.



# සඳකඩ පහණ







- ❖ බෞද්ධ සිද්ධස්ථානයකට පිවිසෙන පියගැට පෙළක ආරම්භයේ දක්නට ඇති අර්ධකවාකාර ගල් පුවරුවයි.
- ❖ අනුරාදපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා ඒ ඒ යුගවල සඳකඩ පහණ නිර්මාණවල ඒ ර් යුගවලට අනන්‍ය ලක්ෂණ ඇත.
- ❖ කලාත්මක බවින් ඉහලම සඳකඩ පහණ අනුරාධපුර බිසෝ මාලිගය අසල ඇතිසඳකඩ පහණ යි.
- ❖ අනුරාධපුර යුගයට අයත් සඳකඩ පහණින් භව චක්‍රය නිරූපනය වන බව සෙනරත් පරණවිතාන මහතාගේ අදහස යි

- අමාවතුරෙහි '"*අඩසඳපහණ*"'
- සද්ධර්මරත්නාවලියේ
- හා පූජාවලියේ "*සඳකඩපහණ*"
- පාලි බෞද්ධ ග්‍රන්ථවල "*අඩ්ඪචන්ද පාසාණ*" ලෙසත් හැඳින්වේ.

# මුරගල



අභයගිරියට අයත් රත්න ප්‍රාසාදය අසල ඇති මුරගල

- සඳකඩ පහණ හෝ පියගැට පෙළක ආරම්භය පිය ගැටපෙළ දෙපස මෙම නිර්මාණය දැකිය හැකිය.
- ආරම්භයේ දී කැටයම් රහිත වූවද පසුව පුන්කලස, බහිරව රූප, පෙණය සහිත නාගරූප, මිනිස් වෙස්ගත් නා රජ රුව මෙයට එක් වී ඇත.
- අභයගිරියට අයත් රත්න ප්‍රාසාදය ගොඩනැගිල්ල සමීපයේ ඇති මුරගල කලාත්මක අත්න් උසස් වේ.

# කොරවක් ගල



- මුරගලට පිටුපසින් පියගැට පෙළ දෙපස කැටයම් සහිතව හෝ රහිතව අත්වැලක් ලෙස දිගැටිව ඇති ගල් පුවරුව කොරවක් ගලයි
- මකර මුඛයකින් නිකුත් වන ලියවැලක්, වෘත්තාකාර දඟරයකින් අවසන් වන ලෙස නිර්මාණය කර තිබීම මෙහි ඇති සුලබ කැටයම් වේ
- කොරවක් ගලේ පිටට පෙනෙන බිත්තියේ සිංහ, හස්ති, නාග හෝ වාමන රූප කැටයමින් විසිතුරු කර ඇත

# අනුරාධපුර යුගයට අයත් සිතුවම් දැකිය හැකි ස්ථාන

වංශකතා සාහිත්‍ය මගින් ද මේ යුගයේ සිතුවම් පැවති ස්ථාන හඳුනාගත හැකිය. නමුත් මෙම යුගයට අයත් සිතුවම් වර්තමානයේ හමුවන්නේ ස්ථාන කිහිපයක පමණි. ඒ අතර සීගිරිය හා හිඳගල විශේෂ තැනක් ගනී. ඉන්දියාවේ පැරණි අජන්තා සිතුවම් වලට නෑකම් කියන සීගිරි චිත්‍ර එකල සිතුවම් කලාවේ අපූර්වත්වය පෙන්නුම් කරන්නකි. පැරණි බෞද්ධ ආරාම හා ලෙන් විහාරවල සිතුවම් මෙයට සමගාමී ව ඇඳ ඇති බව පැහැදිලි ය. හිඳගල විහාරස්ථානයේ දැනට මැකී ගොස් ඇති සිතුවම් සීගිරි සම්ප්‍රදායට අයත් වූවකි.

# අනුරාධපුර යුගයට අයත් සිතුවම් දැකිය හැකි ස්ථාන

01. සීගිරිය

02. හිඳගල

03. වෙස්සගිරිය

# අනුරාධපුර යුගයට අයත් සිතුවම් දැකිය හැකි ස්ථාන

## සීගිරිය චිත්‍ර





- ලංකාවේ පැරනම චිත්‍ර ලෙස සැලකෙන මෙම චිත්‍ර පස්වන සියවසට අයත් වේ.
- මල් ලියකම් සහිත අලංකාර ශීර්ෂාභරණයෙන් සැරසුන හිස් ඇති විවිධ ඉරියව් වලින් යුත් උඩුකය පමනක් දැක්වෙන නාරි රූප මෙ චිත්‍ර මගින් දැක්වේ.
- කාශ්‍යප රජුගේ බිසෝවරු හා සේවිකාවන් පිදුරංගල විහාරයට මල් පූජාව සඳහා යන අයුරු මෙම චිත්‍ර මගින් නිරූපනය කරන බවද ඔවුන් අප්සරාවන් බවද ඔවුන් විජ්ජුලතා හා මේඝලතා නිරූපනය කරන බවටද විවිධ මත පළ වී ඇත.
- මෙම සිතුවම් දඹදිව අජන්තා විහාරයේ බෞද්ධ සිතුවම් ගුරු කොට ගෙන නිර්මාණය කර ඇති බවටද මතයක් පල වී ඇත.
- චිත්‍ර ඇඳීම සඳහා ගල්තලය පිළියෙල කර ඇත්තේ මැටි, කිරිමැ, දහයියා හා කොහුබත් වලින් සකස් කර ගෙන ඇති මිශ්‍රණයක් ආලේප කිරීමෙනි. ඒ මත සුදු හුණු ගා පිරිමැද රතු පැහැයෙන් ආකෘති ඇද තිබේ. ඉන් පසු කහ,රතු හා කොළ වර්ණ යොදා චිත්‍ර සම්පූර්ණ කර ඇත.
- ශරීරයේ හා අඟපසග වල හැඩය පෙනෙන පරිද්දෙන් රේඛා භාවිතා කර තිබේ. විශේෂයෙන්ම අත් ඇඟිලි නිරූපනය කිරීමේදි ඉතා සියුම් ලෙස රේඛා හසුරුවා ඇත. සිහිනිඟ හා පියයුරු වලින් මෙම චිත්‍ර වලට වඩාත් සජීවි බවක් ලැබී ඇත.

# අනුරාධපුර යුගයට අයත් සිතුවම් දැකිය හැකි ස්ථාන

හිඳගල






- සීගිරි චිත්‍ර සම්ප්‍රදාය ගුරු කරගත් චිත්‍ර මහනුවර ආසන්නයේ හිඳගල විහාරයේ දක්නට ඇත.
- ක්‍රි.ව. 7 වන සියවසට අයත් මෙම චිත්‍ර දැන් මැකී ගොස් තිබේ.
- සීගිරි සිතුවම් වලටත් වඩා ප්‍රාණවත් රේඛා භාවිතය තුළින් මෙම චිත්‍රවලට ලැබී ඇත. මිනිස් රූප නොයෙක් ඉරියව් වලින් දැක්මට මෙම සිත්තරා සමත් වී ඇත.

# පොළොන්නරු යුගයේ කලාව

පොළොන්නරු යුගයේ පැරණිම සඅත්වම් පැවති ස්ථාන ලෙස මහියංගණ ස්තූපයේ ධාතු ගර්භය, දිඹුලාගල ලෙන් හා තිවංක පිළිමගෙය හඳුනාගෙන ඇත. මේ ස්ථානයන්හී පැවති චිත්‍රවල බෝධිසත්ත්ව චරිතයේ හා බුද්ධ චරිතයේ විවිධ අවස්ථාවන් නිරූපණය කෙරේ. එ බව දැනට ශේෂ වී ඇති සිතුවම් කොටස් තුළින් හඳුනාගත හැකිය. විශේෂයෙන් මේ යුගයේ විශාලතම චිත්‍රාවලිය දක්නට ලැබෙන්නේ පොළොන්නරුවේ තිවංක පිලිම ගෙයෙනි. මහා පැකුම්බා රජු විසින් කරවන ලද ජේතවනාරාමයේ පිළිම ගෙය මේ නමින් හඳුන්වා ඇත. මෙහි ගර්භගෘහයේ ඇති සිතුවම් තුළින් බුද්ධ චරිතයත් අන්තරාලයේ ඇති සිතුවම් මඟින් ජාතක කථාත් නිරූපණය වේ. එම සිතුවම් අතර බුදුරජාණන් වහන්සේ දෙව්ලොව සිට සංකස්සපුරයට වැඩම කිරීම ද සස, වෙස්සන්තර, සාම ආදී ජාතක කථා රැසක් ද දක්නට ලැබේ. මේ සියලු කරුණු තුළින් පෙන්නුම් කෙරෙන්නේ එකල දියුණු චිත්‍ර කලාවක් පැවති බවයි.

# පොළොන්නරු යුගයට අයත් සිතුවම් දැකිය හැකි ස්ථාන

01. මහියංගණ ස්තූපයේ ධාතු ගර්භය

02. දිඹුලාගල ලෙන්

03. තිවංක පිළිමගෙය

# පොළොන්නරු යුගයට අයත් සිතුවම්



මහියංගනය ස්තූපයේ
ධාතු ගර්භයේ සිතුවම්



- මෙම චිත්‍ර අතරින් විශාලම චිත්‍රය ලෙස සැළකිය හැක්කේ බුදුරදුන් බෝ මුල අබියස වැඩ සිටින ආකාරයත් ඒ අසළින් තාපස ලීලාවක් දක්වන අයෙකු වාඩි වී සිටින ආකාරයත් දැක්වෙන චිත්‍රය යි.
- බුද්ධත්වයට පත්වීම දැක්වෙන චිත්‍රයේ බුදුරදුන් වැඳ පුදා ගැණීමට තුන් ලොවින් පැමිණි දෙවියන්ද මල් අතින් ගත් විෂ්ණු දෙවියන්ද මාරයා පැරදී පලා යාමද දක්නට ලැබේ.
- චිත්‍රකරණය සඳහා යොදාගෙන ඇති වර්ණ අතර රතු, කහ, සුදු, දුඹුරු යන වර්ණ උපයෝගී කරගෙන ඇත. පොළෙන්නරු යුගයේ සම්ප්‍රදායික රේඛා චිත්‍ර අතර පැරණිතම චිත්‍ර වශයෙන් මෙම චිත්‍ර හැඳින්විය හැකිය.

# පොළොන්නරු යුගයට අයත් සිතුවම්

## දිඹුලාගල ලෙන තුළ ඇති සිතුවම්

- බිත්තියේ රඹ පාටට හුරු කහ පැහැයක් යොදා දුඹුරු රතු පැහැයෙන් චිත්‍ර ඇඳ ඇත.
- චිත්‍රවල මානව රූපවල රඹ පැහැය ශරීරයට යොදා ඇත.



# පොළොන්නරු යුගයට අයත් සිතුවම්

## තිවංක පිළිමගෙය තුළ ඇති සිතුවම්





- පොළොන්නරු යුගයේ විශාලතම චිත්‍රාවලිය තිවංක පිළිම ගෙය තුළ දක්නට ලැබේ.
- මෙහි ගන්ධකුටියේ ඇති චිත්‍රවිශාල වශයෙන් බුද්ධ චරිතය නිරූපනය කරන අතර අන්තරාලයේ සිතුවම් වලින් ජාතක කථා නිරූපණය කරයි.
- මට සිළිටු කළ වියළි බිත්ති මත රතු පැහැයෙන් චිත්‍රවල බාහිර රේඛා නිරූපනය කර ඇති අතර කහ හා කොළ වර්ණ යෙදා චිත්‍ර සම්පූර්ණ කර තිබේ.
- අජන්තා චිත්‍ර සම්ප්‍රදාය අඛණ්ඩව ලංකාවේ 12 වන සියවස දක්වාම පැවති බව තිවංක පිළිම ගේ බිතු සිතුවම් මගින් පැහැදිළි වේ. බුදුහිමි දෙව්ලොව සිට සංකස්ස පුර වෙත වැඩම කිරීම, විශාලා මහනුවර තුන්බිය දුරලීමට වැඩම කිරීම පිළිබඳ සිතුවම් අද ද පැහැදිලිව හඳුනා ගත හැක. අන්තරාලයේ සිතුවම් වලින් **සස ජාතකය** විදහා දැක්වෙන සිතුවම පැහැදිලිව හඳුනා ගත හැක. මෙම සිතුවමට අමතරව වෙස්සන්තර ජාතකය, ගුත්තිල ජාතකය, සාම ජාතකය, කුස ජාතකය, මහා උම්මග්ග ජාතකය, පිළිබිඹු කරන චිත්‍ර ද මේ සිතුවම් අතර දක්නට ඇත.

# පෞරාණික උරුමයන් රැක ගැනීම සඳහා පිහිටුවා ඇති ආයතන

- පුරා විද්‍යා දෙපාර්තමේන්තුව
- මධ්‍යම සංස්කෘතික අරමුදල
- ජාතික කෞතුකාගාරය

# පෞරාණික උරුමයන් රැක ගැනීම සඳහා අපට කළ හැකි දේ

- ✓ පැරණි ගඩොල් බැමි මත ඇවිද යාමෙන් වැළකීම
- ✓ එම ස්ථාන වල ඇති චිත්‍ර, කැටයම් වැනි දේ කුරුටු ගෑමෙන් හෝ සීරීමෙන් වැළකීම
- ✓ පැරණි නිර්මාණ හෝ ගඩොල් මත වාඩි වී සිටීමෙන් වැළකීම

# තෙරුවන් සරණයි...!